දෙපාර්තමේන්තු චක්‍රලේඛන - 2018/15

මාගේ අංක - බ/13/02(i)/පොදු/2018.
ප්‍රත්‍යාකාරම් ගිණුම් අංශය,
භාණ්ඩාගාර මූලස්ථානය,
කොළඹ 09.
2018-11-07 දින දී

සියළුම මාණ්ඩලික නිළධාරීන්,
සියළුම භාණ්ඩාගාර අධිකාරීන් සහ
සහකාර භාණ්ඩාගාර අධිකාරීන් වෙත.

## 2018 මුදල් වර්ෂය සඳහා අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම.

### 1. රජයේ බිල්පත්

සියළුම රජයේ බිල්පත් 2018.12.31 දිනට පෙර (මීට අදාල වන චක්‍රලේඛ උපදෙස් අනුව) මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර මූලස්ථාන පොත් සමඟ සසඳා ගතයුතු බැවින්, මෙම බිල්පත් වර්ගීකරණ විස්තර නියමිත දිනට පෙර අනිවාර්යයෙන්ම ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. භාණ්ඩ හා සැපයුම් සඳහා වන ඇණවුම් භාර ගැනීම 2018.12.20 දිනෙන් අවසන් කලයුතු අතර, ඊට පසු කිසිම ඇණවුමක් භාර නොගැනීමට වගබලා ගතයුතුය. 2018.11.30 දිනයට අවසන් මාස 11 සඳහා සියළුම බිල්පත් වල සාරාංශයන් 2018.12.10 වෙනි දිනයට පෙර මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

බිල්පත් නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර 7 (ඇමුණුම් අංක 01) විධිමත් ආකෘති පත්‍රය පමණක් භාවිතා කළ යුතුය.

2018 වර්ෂයේ සම්පූර්ණ විකුණුම් හා ඒ සඳහා වූ බිල්පත්වලට, අදාළ අංශ වර්ගීකරණය සකස් කල යුතු අතර, 2018 නොවැම්බර් 30 දක්වා වූ විකුණුම් වෙනුවෙන් අදාල වර්ගීකරණය 2018.12.10 දිනටත් 2018 දෙසැම්බර් මාසය සඳහා වූ බිල්පත් වර්ගීකරණය 2019.01.05 දිනට හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කලයුතු ය.

වර්ගීකරණය සැකසීමේදී ඇමුණුම් අංක 02 පරිදි ආකෘති පත්‍රයට අනුකූලව ක්‍රියා කිරීමට වග බලා ගත යුතු අතර බිල්පත් සංශෝධනය වී නම් එම සංශෝධිත බිල්පත් විස්තර ඇතුළත් කර සකස් කරන ලද වර්ගීකරණ වාර්තාව 2018.12.10 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය.

### 2. පුද්ගලික බිල්පත්.

පහත පරිදි කටයුතු කලයුතු අතර, මුළු පුද්ගලික බිල්පත්වල එකතුව මුදල් පොතේ බැර කිරීම් වලට සමාන විය යුතුය. අංශ අනුව පුද්ගලික බිල්පත් වල "ආ" මිල විස්තර නිසි පරිදි පිළියෙල කොට 2019.01.05 දිනයට පෙර මූලස්ථානයට ඉදිරිපත් කර අවසන් කල යුතුවේ. 2018.11.30 දිනට අවසන් වන මාස 11 සඳහා සියළුම බිල්පත් වල සාරාංශ 2018.12.10 වෙනි දිනට පෙර මූලස්ථානය වෙත යොමු කලයුතු ය. 2018 දෙසැම්බර් මාසය සඳහා වන පුද්ගලික බිල්පත් හා වර්ගීකරණය 2019.01.05 දිනට හෝ ඊට පෙර යොමු කල යුතු ය.

බිල්පත් නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර 7 (ඇමුණුම් අංක 01) විධිමත් ආකෘති පත්‍රය පමණක් භාවිතා කළ යුතුය. වර්ගීකරණය සැකසීමේදී ඇමුණුම් අංක 02 පරිදි ආකෘති පත්‍රයට අනුකූලව ක්‍රියා කිරීමට වග බලා ගත යුතු අතර බිල්පත් සංශෝධය වී නම් එම සංශෝධිත බිල්පත් විස්තර ඇතුළත් කර සකස් කරන ලද වර්ගීකරණ වාර්තාව 2018.12.10 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය.

3. <u>රජයේ හා පුද්ගලික කර්මාන්ත හා අනෙකුත් බිල්පත් නිරවුල් කිරීම.</u>

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට නිරවුල් කල යුතු රජයේ බිල්පත් නිරවුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙතින් විගාම ලබාගෙන නිරවුල් කළ යුතුය. සියළුම නිරවුල් කිරීම් චෙක්පත් මගින් හා 2018.10.17 සිට 2018.12.28 වන දින තෙක් පමණක් ක්‍රියාත්මක වන පරිදි හරස් සටහන් මගින් සිදුකර 2019.01.02 වන දිනට පෙර මූලස්ථානය වෙත එවිය යුතුයි. හරස් සටහන් මගින් බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබිය යුතු අතර, ප්‍රතිපාදන ඔබ වෙත නොමැතිව කරන ලද නිරවුල් කිරීම් වෙනුවෙන් විගණන විමසුම් වලට ලක්විය හැකි බැවින් මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. තවද, මෙම හරස් සටහන් මගින් නිරවුල් කරන ලද කර්මාන්ත බිල්පත් පිළිබඳ විස්තර, බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය.

4. <u>කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ අවසාන ගිණුම් වාර්තා.</u>

ඉහත දක්වා ඇති කරුණු සැළකිල්ලට ගෙන ගිණුම් පියවීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව කාර්මික හා කෘෂිකාර්මික අවසාන ගිණුම් වාර්තා ද සකස් කර 2019.01.10 දිනට පෙර මූලස්ථානයට එවීමට ඔබේ පෞද්ගලික අවධානය යොමු කරවන ලෙස දන්වමි. ප්‍රමාද වී අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව නිතර නිතරම විගණන විමසුම්වලට ලක්වන හෙයින්, මෙම වර්ෂයේ නියමිත දිනට පෙර මෙම ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

i. <u>අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම.</u>

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව අවසන් ගිණුම් සකස් කළ යුතු ආකෘතිය ඇමුණුම් අංක 03 ලෙස මේ සමඟ ඉදිරිපත් කරමි. ඒ අනුව 2018 වසර සඳහා අවසන් ගිණුම් වාර්ථා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව නිෂ්පාදන කටයුතු හා සෘජුවම සම්බන්ධවන වියදම් පමණක් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වියදම් සේ සැලකිය යුතු අතර එසේ නොවන කර්මාන්ත කටයුතු වලට අදාළ වෙනත් වියදම් ලාභ අලාභ ගිණුමේ වියදම් වර්ගීකරණයන් යටතේ ගැලපිය යුතුයි.

ii. <u>තොග අගය කිරීම</u>

තොගවල අගය ගිණුම්වල ඇතුලත් කිරීමේ කාර්යයන් සඳහා 2018.12.31 වන දිනට ඉතිරි (නිමි හා නොනිමි) තොග, භෞතික සත්‍යාපන පිරික්සුමට භාජනය කර පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කර, වාර්ෂික ගිණුම සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, එසේ කටයුතු සිදුකල බවට බන්ධනාගාර අධිකාරි විසින් සහතික කල යුතුය. අමුද්‍රව්‍ය,නොනිමි හා නිමි තොග වාර්ථා 2019.01.10 දින හෝ ඊට පෙර ඇමුණුම් අංක 04 හි සඳහන් ආකෘතිය අනුව අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතුය.

iii. <u>කල්පිත ගාස්තු</u>

මු.රෙ.510 ප්‍රකාරව කල්පිත ගාස්තු සඳහා ගෙවීම් කරනු ලැබුවහොත් වර්ෂය සඳහා අදාළ කටයුත්තේ ලාභය කෙරෙහි කොතෙක් දුරට එය බලපානු ඇත්දැයි පෙන්නුම් කිරීම පිණිස කල්පිත ගාස්තු සටහන් ගිණුමක් වාර්ෂික ලාභාලාභ ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතු බැවින් කර්මාන්ත හා කෘෂිකාර්මික කාර්යයන් සම්බන්ධ 2018 වසරට අදාළ වැටුප් අතිකාල, දුරකථන, විදුලිය, ජලය ආදී ගෙවීම් එක් එක් වැය ශීර්ෂය යටතේ අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. එහිදී කල්පිත ගාස්තු ගණනය කිම සඳහා ඔබ විසින් යොදා ගත් පදනම කල්පිත ගාස්තු ගණනය කිරීමට පහතින් දැක්විය යුතුය. **(ඇමුණුම අංක 05)**

5. <u>සත්වයන්ගේ අගය.</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සත්ව තෙග ගිණුම් ගත කිරිම සඳහා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 24/2015 අනුව කටයුතු කල යුතුය. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්ව තොග වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙලිදරව් කිරිම සඳහා ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම් ගත කිරිමට සංචිත ගිණුමක් හා සත්ව තොග ස්ථාවර වත්කම් ගිණුමක් ලෙස පවත්වා ගත යුතුයි. මේ අනුව වෙළඳ හා ලාභාලාභ ගිණුමේ එම සත්ව තොග දැක්විම සිදු නොවන අතර ශේෂ පත්‍රයේ ද ජංගම ගිණුම වත්කම් ලෙස පෙන්නුම් කරනු නොලැබේ. මේ සඳහා සත්ව තොග සංචිත ගිණුම හා ස්ථාවර වත්කම් යටතේ සත්ව ගිණුමක් පවත්වා ගෙන යනු ලැබේ. එම නිසා සතුන් පිළිබඳ සියළු තොරතුරු විස්තරාත්මක වශයෙන් ඇමුණුම් අංක 06 පරිදි මූලස්ථානය වෙත වාර්ථා කළ යුතුයි. ඒ අනුව වෙළඳ හා ලාභාලාභ ගිණුමේ සත්ව නිෂ්පාදන සඳහා දරනු ලබන ආදායම් වියදම් පමණක් ඇතුලත් කරනු ලැබේ. සතුන් විකිණීම හෝ ඉවත් කිරිම සත්ව අංශයේ ගිණුමක් මගින් ගැලපිම් කර ලාභය / අලාභය පමණක් වෙළඳ හා ලාභාලාභ ගිණුමට ඇතුලත් කල යුතුයි.

ඉහත තත්වය අනුව 2018 මූළ වර්ෂය සඳහා සකස් කරනු ලබන වාර්තාව 2019.01.10 දින හෝ ඊට පෙර මූලස්ථානයේ අත්තිකාරම් ගිණුම් අංශයට ලබා දෙන ලෙස දැනුම් දෙමි.

දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 914 ට අනුව අවුරුද්ද අවසානයේ සමීක්ෂණ මණ්ඩලය මගින් හරි වැරදි බැලිමට පෙර සෑම වර්ෂයකම ප්‍රවීණ නිළධාරියකු (පශු වෛද්‍යවරයා) විසින් සත්වයන්ගේ අගය තක්සේරු කල යුතුය. සත්වයින්ගේ අංක ද, වටිනාකම ද දැක්වෙන පරිදි අනුපිටපතකින් ද යුත් ප්‍රකාශයක් සකස් කොට තක්සේරු කළ නිළධාරියා විසින් එය නිසි පරිදි සහතික කළ යුතුය. එහි එක් පිටපතක් සමීක්ෂණ මණ්ඩලයේ රපොර්තුවට ඇමිණිය යුතු අතර අනෙක් පිටපත වාර්ථාවක් වශයෙන් ගොවිපලේ හෝ ස්ථානයේ ගොනුකර තැබිය යුතුය. ඇමුණුම් අංක 06 සඳහන් පරිදි සත්වයන් පිළිබඳ තොරතුරු ලේඛණය මූලස්ථානය වෙත එවීමේදී ඒ සමඟ පශු වෛද්‍යවරයා විසින් සහතික කළ තක්සේරු වාර්තාවේ පිටපතක් ද මූලස්ථානය වෙත එවිය යුතුය.

6. <u>ස්ථාවර වත්කම් ක්ෂය කිරිම</u>

බන්ධනාගාර කර්මාන්ත හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛණය උපයෝගී කර ගෙන 2018 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ක්ෂය විම් 2019.01.10 දිනට පෙර ඇමුණුම් අංක 07 ලෙස ඉදිරිපත් කර ඇති ආකෘතියේ ආකාරයට මූලස්ථාන ගිණුම් අංශය වෙත එවිය යුතුයි. එම ආකෘති ප්‍රකාරව සියළු තෙරෙතුරු ඇතුලත් කිරිම අනිවාර්ය වේ.

ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව නිවැරදිව දේපළ, පිරියත හා උපකරණ වත්කම් වෙන් වෙන්ව ක්ෂය ගණනය කිරීම්, ගිණුම්ගත කිරිම හා නිවැරදි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරිමේ අරමුණින් යුතුව මාගේ අංක බ13/02 (1)/පොදු/2016 අංක දරණ හා 2017.10.25 දිනැති ලිපිය මගින් ලබා දී ඇති අනුමැතිය අනුව පහත පරිදි දේපළ, පිරියත හා උපකරණ පන්ති වර්ග කොට ක්ෂය කිරිම සිදු කළ යුතුය.

| දේපළ, පිරියත හා උපකරණ පන්ති | වාර්ෂික ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 4% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 10% |
| ලි බඩු හා සවි කිරිම් | 20% |
| කාර්යාල උපකරණ | 15% |
| සුළු උපකරණ | 15% |

ක්ෂය කරනු ලබන ස්ථාවර වත්කම් සඳහා, ඒ ඒ වත්කම් මිලදී ගත් දිනය සැලකිල්ලට ගෙන හීන වන ශේෂ ක්‍රමය මත ක්ෂය ගණනය කල යුතුය. භාවිතයට ගත නොහැකි තත්වයේ පවතින ස්ථාවර වත්කම් ඇත්නම් භෞතික පරීක්ෂණයකට ලක් කර ඒවා අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. කපා හැරීම් කරනු ලබන වත්කම් සඳහා කපාහරිනු ලබන වර්ෂයේ ක්ෂය ගණනය නොකෙරේ.

7. <u>බැරකම් වාර්තා</u>

2018 වසරට අදාළ බැරකම් වාර්තා **ඇමුණුම් අංක** 08 හි දැක්වෙන ආකෘතියට අනුව සකස් කර 2019.01.10 දිනට හෝ ඊට පෙර මූලස්ථානයට එවිය යුතුයි. 2018 වසර සඳහා බැරකම් නොමැති නම් බැරකම් නොමැති බවට හිස් වාර්තාවක් එවිය යුතුය.

2017 වසරට අදාළ බැරකම් 2018 වසරේ අවසන් ගිණුම් තුළ ගැලපුම් කර ඇති ආකාරය **ඇමුණුම් අංක** 09 හි දැක්වෙන ආකෘතිය අනුව සකස් කර 2019.01.10 දිනට හෝ ඊට පෙර මූලස්ථානයට එවිය යුතුයි.

8. **<u>ශේෂ සනාථ කිරීම</u>**

2018.12.31 දිනට ඔබ ආයතනය සතුව බැරකම් පවති නම් එම බැරකම් ශේෂ සනාථ කිරීම සඳහා **ඇමුණුම් අංක** 10 හි සඳහන් අකෘතිය අනුව සකස් කරන ලද සනාථ කිරීමේ සහතිකයක් එම අදාළ ආයතන වෙතින් ලබාගෙන අවසාන ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතුය.

එමෙන්ම ඔබ ආයතන විසින් අලෙවිකරන ලද භාණ්ඩ හා සේවා සඳහා 2018.12.31 දිනට අයවීමට ඇති හිඟ බිල්පත් සම්බන්ධ තොරතුරු අදාළ ණයගැති ආයතන වෙත යොමු කර **ඇමුණුම් අංක** 11 මඟින් ලබා ගන්නා තොරතුරු හා එම තොරතුරු අනුව ඔබ විසින් සකස් කරන ලද **ඇමුණුම් අංක** 12 හි සඳහන් ආකෘතියට අනුව සකස් කරන ලද ණයගැති ශේෂ සනාථ කිරීමේ සහතික අවසන් ගිණුම් වාර්ථා සමඟ ඉදිරිපත් කළ යුතුය. (මෙම ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කිරීම අතවශ්‍ය කරුණක් ලෙස සලකා විගණකාධිපතිගේ 154(6) විගණකාධිපති වාර්තාව අනුව ඉදිරිපත් කර ඇත. එබැවින් මේ පිළිබඳවිශේෂ අවධානය යොමු කළ යුතු බව වැඩිදුරටත් දැනුම් දෙමි.)

බන්ධනාගාර ආයතන වල කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට අදාල නිළ බැංකු ගිණුම මඟින් 2018.12.31 දිනට මහා භාණ්ඩාගාරය වෙත මුදල් ප්‍රේෂණය කිරීමට පෙර ශේෂය, අදාල ආයතනයේ බැංකු මඟින් සනාථ කර එවීමට කටයුතු කළ යුතුය.

9. **<u>ගිණුම් සකස් කිරීමේදි විශේෂ අවධානය යොමුකල යුතු කරුණු</u>**

i. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මු.රෙ 502(2) අනුව අත්තිකාරම් කටයුත්ත සඳහා පාවිච්චියට ගනු ලැබූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ලේඛන පවත්වා තිබිය යුතු අතර, අදාල වර්ෂය තුලදී එක් එක් අංශ යටතේ පාවිච්චියට ගනු ලැබූ ස්ථාවර වත්කම්, ඒවායේ වටිනාකම් හා එක් එක් ස්ථාවර වත්කම් වල ක්ෂය වීම් ගණනය ඇතුලු තොරතුරු ඉදිරිපත් කල යුතුය.

ii. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව දේපළ පිරියත උපකරණ වත්කම් වෙන් වෙන්ව ක්ෂය කල යුතුය. එමෙන්ම රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතාංක 07, 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල එක් එක් දේපළ පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් කාලච්ඡේදය ආරම්භයේ හා අවසානයේ වත්කමේ සමුච්චිත ක්ෂය අඩුකිරීමෙන් පසු හඳුනා ගන්නා අගය (ධාරණ අගය) හා සමුච්චිත ක්ෂය අගයන් හෙලිදරව් කළ යුතු අතර , 42 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතමයන් එහි සාධාරණ අගය විශ්වාසදායි ලෙස මැනිය හැකි විම ප්‍රත්‍යාගණිත අගයට වාර්ථා කල යුතුය.

iii. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 09 හි 47 ඡේදය ප්‍රකාරව කාලච්ඡේදය ප්‍රකාරව කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත් ඕනෑම තොග ලියා හැරීම් අගයක් හෙළිදරව් කළ යුතුය.

iv. කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ අමුද්‍රව්‍ය, නිමි හා නොනිමි තොග සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන අගය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය.

v. මූ.රෙ 505 අනුව සෑම මසකට වරක් අත්තිකාරම් කටයුත්ත සඳහා පාවිච්චියට ගනු ලබන තොග බඩු භෞතික සත්‍යාපනයට ලක් කල යුතු අතර එම සමීක්ෂණ වාර්තා අත්තිකාරම් ගිණුම් අංශයට මාසිකව ලබා දීමට කටයුතු කල යුතු වේ.

උදා :- තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වාර්ථා කර ඇත.

vi. කල්පිත ගාස්තු විස්තරාත්මකව ලැයිස්තු සහිතව ප්‍රභව තොරතුරු දැක්විය යුතුය. නිවැරදිව දැක්විය යුතුය. කල්පිත ගාස්තු ඇතුලත් කිරීම් අවම කර ගැනීමටත් සත්‍ය තොරතුරු ගිණුම් වල ඇතුලත් කිරිමටත් කටයුතු කලයුතු වේ. තවද, සත්‍ය තොරතුරු ලබා ගැනීමට අපහසු අවස්ථාවලදී අනුපාත සහ ප්‍රතිශතයන් සැළකිල්ලට ගෙන ගිණුම් ගත කල යුතුය.

vii. වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් අනුව 2018 වසරේ කටයුතු කර තිබිය යුතු වේ. වාර්ෂික සැලැස්ම අනුව ඇස්තමේන්තු වියදම හා අදායම වෙනස් විමට අදාල පිළිගත යුතු කරුණු ඉදිරිපත් කලයුතුය. 2018 ක්‍රියාකාරි සැලැස්ම හා එහි ඉලක්ක සපුරා ගැනිම, වියදම් හා අදායම් වෙනස් විමට අදාල පිළිගතයුතු කරුණු ඉදිරිපත් කළ යුතුය. 2018 ක්‍රියාකාරි සැලැස්ම හා එහි ඉලක්ක සපුරා ගැනිම, වියදම් හා අදායම් ඇස්තමේන්තු වලට අනුරූපව ආදායමේ සත්‍ය තත්ත්වය සසඳා අදාල වාර්තාව 2019 ජනවාරි 05 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එවිය යුතු වේ. (ඇමුණුම 13)

..........................................
එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත් - 1. විගණකාධිපති.
2. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)
3. බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත)

.......................................................... විසින්

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතුය.
THE COMMISSIONER GENERAL OF PRISONS

... Cr.

... Dr.

බිල්පත්‍රයේ අංකය } .....................
Bill No.

To : ..........................................

| භාරදුන් දිනය Date of Delivery | බඩුවල විස්තරය Description of Articles | මිළ Cost රු. Rs. | ශ. c. | ඇණවුම් පිළිබඳ යොමුව Reference to Order | බඩු ඉල්ලුම් කරන නිලධාරියාගේ තොග පොතේ හෝ බඩු ලේඛනයේ හෝ පත් ඉරුව පිළිබඳ යොමුව Reference to Folio of Stock of Inventory Book of Indenting Officer |
|---|---|---|---|---|---|
| | | | | | |

"අ" මිළ නියම } ..........................................
"A" Cost Direct

අනියම් } ..........................................
Indirect

"ආ" මිළ } ..........................................
"B" Cost

කාර්ය ස්ථානය } ..........................................
Station

දිනය } ..........................................
Date

ඉහත සඳහන් මුදල වන රුපියල් } ..........................................
PLEASE with the above sum of Rs.

* (1) 1955.9.2 වැනි දිනය හා 258 වැනි අංකය දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, මුදල් හෝ චෙක්පතක් හෝ මුදල් ඇණවුමක් හෝ එවීමෙන්;
By remitting Cash / Cheque or Money Order for the amount in terms of Treasury Circular, No. 258 of 2.9.1955;

* (2) 391 වැනි මුදල් රෙගුලාසිය අනුව ඒ මුදල පහත සඳහන් පරිදි බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අය පක්ෂයට දමා ඒ පිළිබඳ විස්තරය ලියා එවීමෙන්;
By crediting the amount as follows and furnish particulars of credit to the Commissioner General of Prisons in terms of F. R. 391;

* (3) පහත සඳහන් පරිදි ඒ මුදල අය පක්ෂයට දමමින් සහතික කරන ලද මාරු ඇණවුමක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ට එවීමෙන් බේරුම් කරනු මැනවි;
By forwarding a certified Transfer Order to the Commissioner General of Prisons crediting the amount as follows:–

| | රු. Rs. | ශ. c. |
|---|---|---|
| බන්ධනාගාර කර්මාන්ත ගිණුම / Prison Industries Account ... | ........... | ...... |
| ආදායම් ශීර්ෂය............ උප ශීර්ෂය............ / Revenue Head......... Sub-Head............ ... | ........... | ...... |
| මුළු ගණන / TOTAL ... | | |

..........................................................
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට.

මේ බඩු බාරගෙන, ඒවා ලැබුණු බව මගේ තොග පොතේ / බඩු ලේඛනයේ පසුපිට සඳහන් පත් ඉරුවේ සටහන් කළෙමි.
RECEIVED and brought account my Stock / Inventory Book on folio quoted overleaf.

කාර්ය ස්ථානය / Station: ..............................................

දිනය / *Date*: ..............................................

..............................................................
බඩු ඉල්ලුම් කරන නිලධාරියාගේ අත්සන හා නිල නාමය.
*Signature and Designation of Indenting Officer.*

---

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් / THE COMMISSIONER GENERAL OF PRISONS,

රුපියල් ........................................ක් සඳහා වූ .............................................................. වැනි අංකය
හා ............................................වැනි දිනය දරන ඔබගේ බිල්පත්‍රය ............................................ මාසය පිළිබඳ වූ
මගේ ගණන් හිලව් සාරාංශ පත්‍රයේ මාර්ගයෙන් පහත සඳහන් පරිදි බේරුම් කරන ලදී.

Your Bill No. ......................... dated ........................................................ for Rs. ..................................
has been brought to account through my summary for the month of .................................. as follows:–

| | | රු. Rs. | ශ. c. |
|---|---|---|---|
| බන්ධනාගාර කර්මාන්ත ගිණුම / Prison Industries Account | ... ... | ............ | ...... |
| ආදායම් ශීර්ෂය............ උප ශීර්ෂය............ / Revenue Head......... Sub-Head............ | ... | ............ | ...... |
| මුළු ගණන / TOTAL | ... | | |

..............................................................
බඩු ඉල්ලුම් කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ
අත්සන හා නිල නාමය.
*Signature and Designation of Head of Indenting Department.*

.................... බන්ධනාගාරය,                                                                                    ඇමුණුම් අංක 02

2018/...../......

........................,

........................,

බන්ධනාගාර කෘෂිකාර්මික හා කාර්මික අත්තිකාරම් ගිණුමේ ......................... මස රජයේ / පුද්ගලික බිල්පත් වර්ගීකරණය

| බිල්පත් අංකය | ආයතනය | බේකරි අංශය | කෘෂි අංශය | වාහන සේවා අංශය | සබන් අංශය | වඩු අංශය | වැද්දුම් හා පැස්සුම් අංශය | මුද්‍රණ අංශය | රජක අංශය | කම්හල් අංශය | කොහු ඉදල් අංශය | කොහු මෝල | විවින් අංශය | මැහුම් අංශය | සත්ව පාලන අංශය | පෙදරේරු / මල් පොච්චි | ගඩොල් අංශය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | | | | | | | |

සකස් කළේ - ....................

පරීක්ෂා කළේ -....................

දිනය -

..................................

බන්ධනාගාර අධිකාරී

දිනය -

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන, වෙළෙඳ හා ලාභ ලාභ ගිණුම

ආයතනය :

ඇමුණුම් අංක 03

| | | බේකරි | මැහුම් අංශය | වගා අංශය | වඩු අංශය | වාහන අංශය | පාවහන් අංශය | කොසු/ ඉදල් අංශය | වැල්ඩින් අංශය | ගඩොල් අංශය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ආරම්භක අමුද්‍රව්‍ය තොගය | | | | | | | | | | | |
| 2 | එකතු කළා - අමු ද්‍රව්‍ය ගැණුම් | | | | | | | | | | | |
| 3 | එකතුව (01+02) | | | | | | | | | | | |
| 4 | අඩුකලා- ඉතිරි අමුද්‍රව්‍ය තොගය | | | | | | | | | | | |
| 5 | පාවිච්චි කළ අමුද්‍රව්‍ය පිරිවැය (03-04) | | | | | | | | | | | |
| 6 | එකතු කළා - කම්හල් පිරිවැය- සිර වේතන | | | | | | | | | | | |
| | ඉන්ධන | | | | | | | | | | | |
| | අළුත්වැඩියා | | | | | | | | | | | |
| | ප්‍රවාහන | | | | | | | | | | | |
| | ක්ෂය වීම් | | | | | | | | | | | |
| 7 | එකතුව (05+06) | | | | | | | | | | | |
| 8 | එකතු කළා- ආරම්භක නොනිමි තොගය | | | | | | | | | | | |
| 9 | එකතුව (07+08) | | | | | | | | | | | |
| 10 | අඩුකලා- ඉතිරි නොනිමි තොගය | | | | | | | | | | | |
| 11 | නිෂ්පාදන පිරිවැය- වෙළෙඳ ගිණුම (9-10) | | | | | | | | | | | |
| 12 | ආරම්භක නිමි භාණ්ඩ තොගය | | | | | | | | | | | |
| 13 | එකතුව (11+12) | | | | | | | | | | | |
| 14 | අඩු කළා- කපා හැරීම් | | | | | | | | | | | |
| 15 | අඩු කළා- ඉතිරි නිමි භාණ්ඩ තොගය | | | | | | | | | | | |
| 16 | විකුණුම් පිරිවැය (13-14+15) | | | | | | | | | | | |
| 17 | විකුණුම්- රජයේ i | | | | | | | | | | | |
| | පුද්ගලික ii | | | | | | | | | | | |
| 18 | එකතුව (17i+17ii) | | | | | | | | | | | |
| 19 | අඩු කළා- විකුණුම් පිරිවැය | | | | | | | | | | | |
| 20 | දළ ලාභය (18-19) | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| 21 | (-)ආයතන හා පරිපාලන වියදම් | | | | | | | | | | | |
| | i ක්ෂය වීම් | | | | | | | | | | | |
| | Ii යන්ත්‍ර අළුත්වැඩියා | | | | | | | | | | | |
| | Iii වැටුප් හා වේතන | | | | | | | | | | | |
| | Iv විදුලිය | | | | | | | | | | | |
| | V මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | | | | | | | | | | | |
| 22 | (-) විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | | | | | | | | | | | |
| | i ඉන්ධන වියදම් | | | | | | | | | | | |
| | Ii ප්‍රවාහන වියදම් | | | | | | | | | | | |
| | Iii වාහන අළුත්වැඩියා | | | | | | | | | | | |
| 23 | (-)මූල්‍ය හා වෙනත් වියදම් | | | | | | | | | | | |
| | I තොග කපා හැරීම | | | | | | | | | | | |
| | Ii අනෙකුත් වියදම් | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| 24 | මුළු වියදම් (21+22+23) | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| 25 | ශුද්ධ ලාභය (20-24) | | | | | | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

සකස් කලේ : අත්සන :

නම :

..................................................

බන්ධනාගාර අධිකාරී/සහකාර අධිකාරී

පරීක්ෂා කලේ : අත්සන :

දිනය :

නම :

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
දිනෙන් අවසන් වර්ෂය සඳහා ................. තොග වාර්තාව

ආයතනය :

ඇමුණුම් අංක 04

| ලෙජර් පිටු අංකය | ද්‍රව්‍ය නාමය | පිරිවැය | ශුද්ධ උපලබ්ධි අගය | පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

- 2018.01.01 දිනට අමුද්‍රව්‍ය, නොනිමි හා නිමි තොග වටිනිකම සදහන් කිරීමේ දී එය 2017.12.31 අමුද්‍රව්‍ය, නොනිමි හා නිමි තොගයට සමාන විය යුතුය.

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

සකස් කලේ : අත්සන : .......................................

නම : බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

පරීක්ෂා කලේ : අත්සන : දිනය :

නම:

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
2018.12.31 අවසන් වර්ෂය සඳහා කල්පිත ගාස්තු වියදම් වාර්තාව

ඇමුණුම් අංක 05

ආයතනය :

| ආයතනය | 1001 | 1002 | 1003 | 1101 | 1201 | 1402 | 1403 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | - |
| | | | | | | | | - |
| | | | | | | | | - |
| | | | | | | | | - |
| | | | | | | | | - |
| | - | - | - | - | - | - | - | - |

සකස් කලේ : අත්සන :

නම :

.......................................

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

පරීක්ෂා කලේ : අත්සන :

නම:

දිනය :

## බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
## 2018.12.31 අවසන් වර්ෂය සඳහා සත්ව තොග ලේඛණය

ආයතනය :

ඇමුණුම් අංක 06

| සතුන් වර්ගය | සතුන් ට ලබා දී ඇති අංක | 2018.01.01 දිනට වටිනාකම | | වර්ෂය තුළ මිලට ගැනීම් | | ජීව බර වැඩි වීම | | පරිත්‍යාග ලැබීම් | | සතුන් විකිණීම | | ජීව බර අඩු වීම | | සත්ව තොග කපා හැරීම | | පරිත්‍යාග කර නිදහස් කිරීම | | 2018.12.31 දිනට වටිනාකම | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඒකක මිල | වටිනාකම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | ඒකක මිල | වටිනා කම | |
| | | | | | | | | | | | | | | | | | | | | |

- 2018.01.01 දිනට සත්ව වටිනාකම සඳහන් කිරීමේ දී එය 2017.12.31 දිනට පැවති සත්ව තොගයට සමාන විය යුතුය

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

සකස් කලේ : අත්සන :

නම:

පරීක්ෂා කලේ : අත්සන:

නම :

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

දිනය

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
2018.12.31 අවසන් වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ලේඛණය

ආයතනය :

ඇමුණුම් අංක 07

| අනු අංකය | වැඩ අංශය | ස්ථාවර වත්කමේ නම | එය අයත් දේපල උපකරණ පන්තිය | මිලටගත් වර්ෂය | වාර්ෂික ක්ෂය ප්‍රතිශතය 1 | ගත් මිල 2 | 2017.12.31 දිනට ශුද්ධ අගය 3 | අළුත්වැඩියා 4 | එකතුව 5 (3+4) | 2018 වසරට ක්ෂය 6 (5*1) | 2018.12.31 දිනට ශුද්ධ අගය 7 (5-6) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

සකස් කලේ : අත්සන :
නම:

පරීක්ෂා කලේ : අත්සන
නම

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී
දිනය

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
2018.12.31 සඳහා අවසන් වර්ෂය බැරකම් වාර්තාව

ආයතනය :

ඇමුණුම් අංක 08

| වැඩ අංශය | සැපයුම්කරු | ඉන්වොයිස් අංකය | 2018 අවසන් ගිණුම තුළ ගැලපුම් කර ඇති ආකාරය | වියදම් වර්ගය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අමුද්‍ර ව්‍ය | සිර වේතන | ප්‍රවාහන | ඉන්ධන | අළුත්වැඩියා |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව | | | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

සකස් කලේ : අත්සන :

........................................

නම :

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

පරීක්ෂා කලේ : අත්සන :

දින :

නම:

ඇමුණුම අංක 09

# බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
## 2018.01.01 දිනට බැරකම් වාර්තාව

ආයතනය :

| වැඩ අංශය | සැපයුම්කරු | ඉන්වොයිස් අංකය | වියදම් වර්ගය | | | | | 2018.01.01 දිනට වටිනාකම | 2018 වසරේ නිරවුල් කර ඇත්නම් නිරවුල් කළ දිනය හා චෙක්පත් අංකය | 2018 අවසන් ගිණුමේ වියදම් තුළ ගලපා තිබේද? / නැතිද? යන්න |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අමුද්‍රව්‍ය | සිර වේතන | ප්‍රවාහන | ඉන්ධන | අළුත්වැඩියා | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

.....................................

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

දිනය

සකස් කලේ : අත්සන :

නම:

පරීක්ෂා කලේ : අත්සන

නම

........... බන්ධනාගාරය,

2018/...../......

............................,
............................,
............................,

මහත්මයාණනි,

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයහිමි ශේෂ සනාථ කර ගැනීම සඳහා

ඔබ විසින් .................බන්ධනාගාරය වෙත සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා රුපියල්.............................. ක ගෙවීමට බැරකමක් ඇති බව අපගේ ලේඛණ වල සඳහන් වේ. එම ශේෂ තහවුරු කර දෙන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

..............................
බන්ධනාගාර අධිකාරි

---

බන්ධනාගාර අධිකාරි
................ බන්ධනාගාරය

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයහිමි ශේෂ සනාථ කිරීම

................................ දිනට ..............................බන්ධනාගාරය විසින් මිලට ගනු ලැබූ රුපියල් ........................................................... ක වටනාකමින් යතු බිල්පතක්/බිල්පත් සඳහා 2018.12.31 දින වන ..................................................... වන අප ආයතනය වෙත පියවීමට ඇති බවට මෙයින් සහතික කරමි.

නම :-

අත්සන :-

දිනය :-
(නිළ මුද්‍රාව මඟින් සනාථ කරන්න)

........... බන්ධනාගාරය,

2018/...../......

.............................,
.............................,
.............................,

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති ශේෂ සනාථ කර ගැනීම සඳහා

අප විසින් .................. ඔබ බන්ධනාගාරය/ ආයතනය වෙත සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා රුපියල්............................... ක බිල්පත් නිරවුල් කිරීමට ඇති බව අපගේ ලේඛණ වල සඳහන් වේ. 2018 වසරේ අවසන් ගිණුම් වලට ඇතුලත් එම ශේෂ තහවුරු කර දෙන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

| වර්ෂය | බිල්පත් අංකය | භාණ්ඩ විකුණුම් ආයතනය | බිල්පතේ වටිනාකම | 2018.12.31 දිනට පියවීමට ඇති වටිනාකම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

.......................................................
බන්ධනාගාර අධිකාරි/ ආයතන ප්‍රධානි

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති ශේෂ සනාථ කිරීමේ ලේඛණය

බන්ධනාගාරය :-

| වර්ෂය | ශේෂ සනාථ කල ලිපියේ යොමුව | ආයතනය | අයකර ගැනීමට ඇති වටිනාකම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

සකස් කලේ :-

පරික්ෂා කලේ :-

..................................
බන්ධනාගාර අධිකාරී

## බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම
## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම්/ වියදම් වාර්තාව

ඇමුණුම් අංක 13

ආයතනය :

| අනු අංකය | වැඩ අංශය | ඇස්තමේන්තු ගත ආදායම/වියදම | සත්‍ය ආදායම/වියදම | අතිරික්තය/ ඌණතාවය | අතිරික්තය/ඌණතාවය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි

සකස් කලේ : අත්සන :

නම :

.......................................

බන්ධනාගාර අධිකාරී/ සහකාර අධිකාරී

පරීක්ෂා කලේ : අත්සන:

නම:

දිනය :